had been exchanged or bought/sold, all credit-card transactions, mobile phone, SIM card beneficiaries, gifts to cousins and email records, what photos were in their cameras, with whom, etc. Those Muslims living in the West, visiting their countries of origin are also often profiled (CIA agents, spies).

Most migrants from the Middle East already know that the West has consistently exploited their countries for many decades. The US also has a unique record of invading countries, killing millions upon millions of innocent men, women and children, and leaving behind, utter devastation and chaos, if not anarchy and mayhem, if they do not succeed in installing a puppet regime to milk their national wealth for the future. So, when ordinary citizens suffer injustices at the hands of their own people, they know why. Unlike in the West, "freedom isn't free, and peace is not pretty".

Imagine a new Muslim employee in a Western workplace. What could be termed an achievement simply gaining acceptance over less suitable locals in these unfortunate times, he faces many ordeals to survive. Imagine if Dr Haneef decided to remain here. His every move could be watched with suspicion. Imagine him attempting to sit down for a meal at the canteen. Imagine the unfriendly stares, people removing themselves from around him, not quite so surreptitiously either.

Imagine trying to enrol their child at the local school. Imagine the taunts and insults mindlessly hurled by the schoolyard bullies. Imagine having to deal with a heart-broken child refusing to leave the warmth of her mother to battle the ordeal of school. Imagine being admitted to hospital as a veiled, obviously Muslim woman. What assurance do they have, of fair treatment? Imagine the consequences in terms of alienation. To these people, which global personality would seem like an ultimate saviour?

In countries where citizens or non-citizens could be detained indefinitely without charges, where "extra-ordinary" "renditions" are made to covert torture centres, where phone lines are now routinely and illegally tapped for "chatter", where national leaders lie through their teeth and invade countries or escape public outrage, and the public is willing to compromise civil liberties "in order to combat terror", and where they accept the erosion of democracy at home while it is spread abroad by bombs and the terror of war, ("be nice to America or we'll bring democracy to your country") these people seem to justify and condone the worst crimes against humanity simply so that their lives are not endangered by the remote possibility of a "terror" incident.

If we take the last fifty years of global history, it would be very easy to estimate who has killed how many people. We must never forget events like Hiroshima, Nagasaki, Vietnam, Cambodia, Afghanistan and Iraq, when comparing with New York, Madrid, Bali or London. Our compassion must extend to the unacknowledged victims of incidents like 9-11, all those doctors, workers, engineers, architects, accountants, teachers, dentists, lawyers and business people, whose continued suffering will only exacerbate the misery of our times if allowed to be ignored or forgotten.

සන්නස සාහිත්‍ය තරගාවලිය 2006
සහතික බෙදාදීම සහ
පළමුවැනි තෑග්ග කෙටිකතා සංග්‍රහය
නිකුත් කිරීම
2007 අගෝස්තු 12 වන ඉරිදා
හියුමි ගැලෝඩල් ලේනිත් පෙන්ටර් ශාලාවේදී පැවැත්වුණ වගයි

ඔබ සැමට ස්තූතියි

උතුරු වික්ටෝරියානු ශ්‍රී ලාංකික සුබසාධක
සංගමයේ සභාපති දයාසෝම බමුණුසිංහ මහතා
ඇතුළු සියළුම සාමාජික සාමාජිකාවන් සහ ඔවුන්ගේ
පවුල් වල සැමට

වික්ටෝරියා පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු ලිස් ඩීට්
මහත්මියට

තරගාවලියේ විනිශ්චය මණ්ඩලයේ කටයුතු කළ
ඩී ඩී කුරුප්පු, වී ක ධර්මබන්ධු, ආචාර්ය පාලිත
ගනේවත්ත, ඩබ් එච් උපසේන මහත්වරුනට

දේශන පැවැත් වූ ඩී ඩී කුරුප්පු හා ආචාර්ය පාලිත
ගනේවත්ත මහත්වරුනට

ප්‍රචාරය ලබා දුන් 3ZZZ SBS තිසර ලක්හඬ ගුවන්
විදුලි සහ ශ්‍රී ලංකා ඉවෙන්ට්ස් වෙබ් අඩවියට සහ
අනෙකුත් සියලුම මාධ්‍ය ආයතන වලට
සැරසිළි කටයුතු කළ චින්තක සිරිකුමාර සහ මහිල්
මුනින්ද්‍රදාස සොයුරනට

බෙර වාදනයෙන් සහය දුන් කපිල වංශතිලක හා
පියල් අසංක විතාණගේ සොයුරන්ට

වීඩියෝකරණයෙන් සහය දුන් විජිත කුමාර
සොයුරා ට
ඡායාරූපය ගත් ප්‍රසන්න කුරුකුලසූරිය
සොයුරා ට
ගායනයෙන් සහ වාදනයෙන් සහය දුන්
මිලින්ද රූපසිංහ දර්ශණ අන්තෝනිගේ
සහ ඉෂාන් සංකල්ප සොයුරන්ට

ඉංග්‍රීසි නිවේදන කටයුතු කළ හංසිනී පැළැඳ
දියණියට
කවි ගායනා කළ සෙව්වන්දිකා අබේරත්න
සොයුරියට
කෑම බීම සැපයීමෙන් සහයෝගය දුන් සැමට
ශබ්ද උපකරණ සැපයූ අතුල විජේසූරිය සොයුරාට

ගුවන් ප්‍රවේශපත් සඳහා අනුග්‍රහය දැක්වූ වික්
මෝටර් කෙයා ආයතනයේ වසන්ත වනසිංහ
සොයුරාට
ශාලාව ලබා දුන් නොදර්න් ෆ්ලීට් කෙයා ආයතනයේ
විජිත දෙල්ගම සොයුරාට

විවිධ අයුරින් සහය දුන් ගාමිනි පැළැඳ චම්ල
දසනායක සොයුරන්ට හා සුගන්ධි ගජමන් සොයුරියට
තරගාවලියට නිර්මාණ එවූ සියලුම ලේඛක
ලේඛිකාවනට
නන් අයුරින් සහය දුන් සියලුම හිතවතුනට සහ
හිතවතියනට
මේ උත්සවය සඳහා කිසිවකුටවත් පෞද්ගලික
ආරාධනා නොකළ ද, සාහිත්‍යය කෙරෙහි ඇති
ලැදියාව නිසා ම, උත්සවයට සහභාගි වූ සියලුම
හිතවතුනට හිතවතියනට සහ සුබ පැතුම් එවූ
සියලුම අයට

අසෝක සුබසිංහ
ශ්‍රීනාත් මද්දුමගේ
ශ්‍රියානි ජයවික්‍රම මද්දුමගේ
දසුන් ගජමන්
සංවිධායක මණ්ඩලය

බෙරික් ශාඛ්‍ය මුණි විහාරයේ දහම් පාසල් සිසු දරු දැරියන් ගේ පොසොන් බැති ගී ගායනය

සේයා රූ ප්‍රසන්න කුරුකුලරත්න

හීං නගාලගෙ නැන්දගෙ මාමාගෙ වස්දොස් දුරු කරවන සරියේ ඕං බලාපං දහ අට සන්නිය නටනා හැටි මෙල්බන් පුරයේ

පුතා - තාත්තෙ .. මොකක්ද තාත්තෙ දහඅට සන්නිය කියන්නෙ?

තාත්තා - ඒක මේ පොඩි වෙලාවකින් කරන්න පුලුවන් දෙයක් නෙවෙයි පුතේ.. හප්පේ අපි පොඩි කාලේ දහඅට සන්නි නටනවා කොච්චර දැකලා තියෙනවද.. දැන් මේ පුතාලට වාසනාවක් නැහැ ඒ වගේ නාට්‍යයක් බලන්න

පුතා - නාට්‍යයක්

තාත්තා - ඔව් පුතේ.. දහඅට සන්නිය බලනකොට නාට්‍යයක් බලනවා වගේ තමයි.. නාට්‍යයක තියෙන්න ඕනෙ නාට්‍යමය අංග ඔක්කොම තියෙනවා.. නැටුම් ගැයුම් දෙබස් විහිලු තහලු පසුතල දර්ශන අංග රචනා මේ හැම දෙයක්ම ඒකෙ තියෙනවා..

පුතා - ආ ඇත්තද? ඒත් තාත්තා කිව්වෙ නැහෙනෙ දහඅට සන්නිය කියන්නෙ මොකක්ද කියලා..

තාත්තා - මං එහෙනං කෙටියෙන් කියන්නම්.. දහඅට සන්නිය කියන්නෙ පුතේ ශාන්තිකර්මයක්.. රාජමුලු සන්නි යක්ෂියා හෙවත් කෝල සන්නි යක්ෂයා ප්‍රධාන යක්කු 18 දෙනෙක් මුල් කරගෙන පවත්වන තොයිලයට තමයි දහඅට සන්නිය කියන්නෙ..

පුතා - පොඩ්ඩක් ඉන්න.. තාත්තා වැරදිනෙ.. කෝල සන්නි යක්ෂයයි තවත් යක්කු 18 දෙනෙක් නම් එතන 19 දෙනෙක් ඉන්නවානෙ.. ඇයි දහඅට සන්නිය කියන්නෙ..

තාත්තා - යක්කු 19 දෙනෙක් තමයි.. ඒ වුණාට ව්‍යවහාරයේ පවතින්නේ හැමෝම කියන්නෙත් දහඅට සන්නිය කියලයි..

පුතා - ඉතිං මේ යක්කු මොනාද කරන්නෙ?

තාත්තා - මේ යක්කු කරන්නේ මිනිස්සු ලෙඩ කරන එක.. රාජමුලු සන්නි යකා තමයි නායකයා.. එයත් එක්ක අනිත් 18 දෙනා එකතු වෙලා නායකයාගේ අණ පරිදි මිනිස්සුන්වි ලෙඩ කරවනවා.. අපේ ගමේ වැලිගම හිටපු එච් එම් ගෝමිස් ගුරුන්නාන්සේ සුප්‍රසිද්ධ පහතරට නැට්ටුවෙක්.. දේශ දේශාන්තරවල ගිගිල්ලා ලංකාවට කීර්තියක් ගෙනාව ගුරුන්නාන්සේ කෙනෙක්.. එයා කියන විදිහට යක්කු 18 දෙනා මෙහෙමයි.

කන සන්නිය	අමුක්කු සන්නිය
කොර සන්නිය	ගුල්ම සන්නිය
ගිණි ජල් සන්නිය	දේව සන්නිය
වැඩි සන්නිය	නාග සන්නිය
දෙමල සන්නිය	මුර්තු සන්නිය
කපාල සන්නිය	කාල සන්නිය
ගොලු සන්නිස	පිත් සන්නිය
බිරි සන්නිය	වාත සන්නිය
මරු සන්නිය	සෙලෙස්ම සන්නිය

මේ කියන හැම යකෙක්ම මේ නම්වලින් හැඳින්වෙන ලෙඩ රෝග හදනව කියලයි කියන්නෙ..

පුතා - කොහොමද තාත්තෙ මේ යක්කු හැදුනෙ? තාත්තා - ඒකට කතන්දර ගොඩක් තියෙනවා.. අපි දහඅට සන්නියේ එන යකයි ගුරුන්නාන්සෙයි අතරෙ වෙන මේ දෙබස බලමුකො..

යකා - අපේ පිය රජ්ජුරුවො අපේ මැණියන්ද්‍ය මැරුවේ මේ කඩුවෙන් තමයි.. හොඳයි උඹ මාව අඳුනනවද නැද්ද?

ගුරුන්නාන්සෙ - උඹලයි රට දන්නෙත් නැහැ.. උඹලයි අම්මව දන්නෙත් නැහැ.. තාත්තා දන්නෙත් නැහැ.. මම දන්න කාලකන්නියෙක් නැහැ..

යකා - ඒයි. අපේ රට විකා විකාලා..

ගුරු - එහෙනං උඹලයි රට වවුල් හපේ වගේ ඇති.. එහෙම නොවෙයි යෝදයෝ විසාලා මහනුවර..

යකා - උඹ දන්නවද විසාලා මහ නුවර අසෝකට බාල කුමාරිකාවක්..?

ගුරු - අසෝකට බාල නම් බිළිඳු ඇති.. එහෙම නෙවෙයි.. අසුපාල කුමාරිකාව..

යකා - ඒ අසුපාල කුමාරිකාව නමයි අපේ අම්මා..

ගුරු - උඹලගේ අම්මා හොඳයි.. උඹලගේ තාත්තා කවිද?

යකා - අංකපාල රජ්ජුරුවෝ

ගුරු - ඌ මීහරකෙක්? උඹලගේ තාත්තා හරකෙක්.. අං කපන්න වෙන්නෙ ඒකයි.. එහෙම නෙයි.. සංඛපාල රජ්ජුරුවො උඹලයි තාත්තා..

මේ විදිහට මේ දෙබස් බොහොම රසවත්ව ඉදිරියටම යනවා. සංඛපාල රජ්ජුරුවන්ට යුද්දෙකට යන්න වුණා. එතකොට අසුපාල කුමාරිකාව ගැබ්අරගෙන හිටියා. නමුත් ඒක රජ්ජුරුවො දැනගෙන හිටියෙ නැහැ. දොළ දුකක් හැදිලා මි අඹයක් කකා ඉන්නකොට සේවිකාවක් අඹේ ඉල්ලුවා. අඹේ දුන්නෙනැති කේන්තියට රජ්ජුරුවෝ ආවාම අර ගෑනි කේලාම් කිව්වා. ඒ කේලාම් අහලා රජ්ජුරුවෝ කඩුවෙන් කපලා බිසෝව මරලා දැම්මා. බිසොව මැරුණත් බඩේ සිටි දරුවා මියගියේ නැහැ. ඔහු තමයි රාජමුලු සන්නි යකා වුණේ.

බෞද්ධ සාහිත්‍යයෙන් විසාලා මහනුවර දුර්භික්ෂය ඇති කලේ මේ යක්ෂයන් කියලා කියනවා. ඒ වෙලාවෙදි බුදුහාමුදුරුවන් රතන

සූත්‍රය දේශණා කරලා මේ යකුන් දමනය කළ බවත් කියවෙනවා..

රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රැවිය මට
ඇදුරු මට දැකා හර බිල්ල ගන්නට
පැදුරු පිට තැබුවා යකුට කන්නට

දහඅට සන්නියේ දී කලින් කිව්ව යකුන්ට අමතරව රිරි යකා මහසෝනා අබිමාන යක්ෂයා කලු කුමාරයා සූනියම් යක්ෂණී ආදී නොයෙක් යන්ෂයන්ගේ වෙස් අරගෙන යකැදුරෝ නටනවා.. සූනියම් යක්ෂණී සභාවට වෙස් තුනක් අරගෙන පැමිණෙනවා. ඒක වේශයක් තමයි රූමත් නරුනියකගෙ වේශය. මෙය ඉතාමත් රසවත් හාස්‍යෝත්පාදක රංගනයකි.

යකුදුරා - *ආවි.. හොඳ වැදගත් අම්මණ්ඩියෙක් වගෙයි*
(එවිට යක්ෂණී ඇඹරෙමින් ඔමරි කරන්නට පටන් ගනියි)

යකුදුරා - *කරකවනවා වැඩියි. යාපනයේ භූමිකම්පාවක් වගෙයි. (යකැදුරෝ නොයෙක් විහිලු තහලු කරති. කෙනෙක් ඇයට ආච්චි යයි අමතයි.)*

යක්ෂණී - *මොකක්ද? කුච්චි අම්මා? නොදකිං උඹ?*

වෙන යකැදුරෙක් - *අක්කන්ඩි*

යක්ෂණී - *වට්ටක්කද ? බණ්ඩක්කද?*

මේ දෙබස තවත් දිගට ඇදිලා යනවා පුතේ. බලා ඉන්න අයට හිනා වෙලා පණ යයි. අපි සැප්තැම්බර් 9 වෙනිදා රෝවිල් සෙකන්ඩරි කොලේජ් තියටර් එකට හවහ දෙකට හරි හයට හරි ගියොත් මේක ඉතාමත්ම රසවත් අත්දැකීමක් වෙනවා ඇත්තයි. ලංකාවෙදිවත් බලාගන්නට නොහැකි වන අපේ නැතිවීගෙන යන සංස්කෘතික අංගයක් වන දහඅට සන්නිය මොහදි අපට දැකගන්නට ලැබීම මොන තරම් භාග්‍යයක් ද?

ශ්‍රීනාත් මද්දුමගේ